16. සන්නද්ධ ගැටුම ස්ත්‍රීන්ට සහ ගැහැණු ළමයින්ට බලපාන ආකාරය ගැන ද සාමය ගොඩනැගීමේ දී ස්ත්‍රීන්ට ඇති භූමිකාව ගැන ද සාම ක්‍රියාදමයන් සහ ගැටුම් නිරාකරණය කිරීම්වල පවතින ස්ත්‍රී-පුරුෂ සමාජභාවී මානයන් ගැන ද අධ්‍යයනයක් කිරීමට මහා ලේකම්ට ඇරයුම් කරමින් මෙම අධ්‍යයනයේ ප්‍රතිඵල මත ආරක්ෂක මණ්ඩලයට වාර්තාවක් ඉදිරිපත් කර එය එක්සත් ජාතීන් ගේ සියලු සාමාජික රාජ්‍යයන්ට ලබා දෙන ලෙස ද තවදුරටත් ඇරයුම් කරයි.

17. සාම සාධක මෙහෙයුම් කණ්ඩායම්වල සෑම වැඩ කටයුත්තක දී ම ස්ත්‍රී-පුරුෂ- සමාජභාවී ප්‍රමුඛතා මෙහෙය වීම සම්බන්ධයෙන් ද ස්ත්‍රීන්ට සහ ගැහැණු ළමයින්ට අදල අන් සෑම අංශයක් සම්බන්ධයෙන් ද කෙරෙන්නා වූ වැඩ කටයුතුවල ප්‍රගතිය ආරක්ෂක මණ්ඩලයට ඉදිරිපත් කරන තම වාර්තාවේ සුදුසු සෑම විටම අඩංගු කරන ලෙස මහා ලේකම්වරයා ගෙන් ඉල්ලා සිටී.

18. මේ කරුණු සම්බන්ධයෙන් පවතින උනන්දුව ක්‍රියාත්මකව රඳවා ගෙන යෑමට තීරණය කරයි.

United Nations S/RES/1325 (2000)

**Security Council**

**Resolution 1325 (2000)**

**Adopted by the Security Council at its 4213th meeting, on 31 October 2000.**

**එක්සත් ජාතීන්**

**S/RES/1325 (2000)**

**ආරක්ෂක මණ්ඩලය**

2000 ඔක්තෝබර් 31

## 1325 (2000) වැනි යෝජනාව

**ආරක්ෂක මණ්ඩලය විසින් 2000 ඔක්තෝබර් 31 දින පැවැත් වුනු තම 4213 වැනි රුස්වීමේ දී සම්මත කර ගනු ලැබිනි.**

*ආරක්ෂක මණ්ඩලය,*

තම 1999 අගෝස්තු 25 වැනි දින දරන 1261 (1999), 1999 සැප්තැම්බර් 17 දින දරන 1265 (1999), 1999 සැප්තැම්බර් 17 දින දරන 1265 (1995), 2000 අප්‍රේල් 19 වැනි දින දරන 1296 (2000) සහ 2000 අගෝස්තු 11 වැනි දින දරන 1314 (2000) යන යෝජනා මෙන් ම එහි සභාපති ගේ අදල ප්‍රකාශ සිහි කරමින් ද, එමෙන් ම ස්ත්‍රීන් ගේ අයිතීන් සහ ජාත්‍යන්තර සාමය සඳහා වූ එක්සත් ජාතීන් ගේ දිනයක් (ජාත්‍යන්තර ස්ත්‍රී දිනය) වෙනුවෙන් 2000 මාර්තු 8 වැනි ද එහි සභාපති කළ පුවත්පත් ප්‍රකාශය (SC/6816) සිහි කරමින් ද